ප්‍රධාන කරුණු සංක්ෂිප්තය

BOC සංසද – සමිති හා සමාජවල ඉතුරුම්/ ජංගම ගිණුම				
නිමැවුමේ ස්වභාවය	**ගනුදෙනුකරුට ලැබෙන ප්‍රතිලාභ**	**ආරම්භක තැන්පතු හා ගාස්තු**	**සුදුසුකම**	**ප්‍රධාන නියම හා කොන්දේසි**
• ලංකා බැංකුවේ සංසද යනු සමිති හා සමාජ සඳහාම වෙන්වූ ගිණුම කි. • ජංගම හෝ ඉතුරුම් වශයෙන් ගිණුම් ආරම්භ කළ හැකිය.		• **ගිණුම වසාදැමීමේ ගාස්තු, වෙනත් සාමාන්‍ය ගාස්තු හා අයකිරීම්** ගාස්තු දැනගැනීමට https://www.boc.lk/rates-tariff#general-tariff වෙත පිවිසෙන්න. • **බදු -** පොලිය රජය සහ/හෝ ශ්‍රී ලංකා නියාමන අධිකාරිය හෝ බැංකුව විසින් කලින් කලට නියමකරනු ලබන අදාළ ඉහළ ආදායම් බදු (Advance Income Tax) අඩුකිරීම්, වෙනත් බදු (AIT), ගාස්තු (ඇත්නම්) වලට සහ ව්‍යවස්ථාපිත අයබදුවලට යටත් වේ.	සුදුසුකම් ලබන ගිණුම් - සමිති - සමාජ - පුණ්‍යායතන සමිති - සංගම් - සුබසාධක සමිති - ආගමික සමිති - වෘත්තීය සමිති - ග්‍රාමීය සමිති - මරණාධාර සමිති - වෙළඳ සංගම් - පාසල්වල සුදුසුකම් ලත් සමිති - සහාධිපත්‍ය සමිති	
			ගිණුම විවෘතකිරීම සඳහා අනුගමනය කළයුතු පියවර	
ලංකා බැංකුවේ සංසද - ඉතුරුම් ගිණුම	• **පොලී අනුපාතය** • 'BOC සංසද' ඉතුරුම් ගිණුමේ අවම ශේෂය මත මාසික සේවා ගාස්තු නොමැත.	• **ආරම්භක තැන්පතුව - රු.10,000/-** • **ගිණුම වසාදැමීමේ ගාස්තු – රු.500/-** වෙනත් සාමාන්‍ය ගාස්තු හා අයකිරීම් o බැංකු ප්‍රකාශ ලබාගැනීම o පාස්පොතේ අනු පිටපතක් නිකුත්කිරීම o ගිණුම් ශේෂයන් තහවුරු කිරීම o ස්ථාවර නියෝග ලියාපදිංචිය සහ මුදල් හුවමාරුකිරීම ගාස්තු දැනගැනීමට https://www.boc.lk/ratestariff#general-tariff වෙත පිවිසෙන්න	- සභාපති සහ ලේකම් විසින් සහතික කරන ලද රීති සහ නියෝගවල (සංගමයේ ව්‍යවස්ථාව) පිටපත; - ගිණුම්විවෘතකිරීමට අවසර දෙන මණ්ඩලයේ/ කමිටුවේ යෝජනා සම්මතයේ සහතික කළ පිටපත; - වත්මන් නිලධාරි මණ්ඩලය තේරී පත්වූ රැස්වීමේ වාර්තාවල සහතික කළ පිටපත; - වෘත්තීය සමිති සඳහා - වෘත්තීය සමිති රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කළ ලියාපදිංචි සහතිකය. වෘත්තීය සමිති රෙජිස්ට්‍රාර්වරයා සහ කලින් සිටි නිලධාරි මණ්ඩලය විසින් නිලධාරි මණ්ඩලය වෙනස්කිරීම ස්ථිරකරනු ලැබිය යුතුය; - අදාළ අධිකාරිය විසින් නිකුත් කළ ලියාපදිංචි සහතිකයේ සහතික කළ පිටපත; - ඇටර්නි බලපත්‍රයේ සහතික කළ පිටපතක් හෝ මණ්ඩලයේ/ කමිටුවේ යෝජනා සම්මතය හෝ ගිණුම ක්‍රියාත්මකකරනු ලබන පුද්ගලයන් තෝරාපත්කරනු ලැබූ රැස්වීම්වල වාර්තාවල සහතික කළ පිටපත සමග ගනුදෙනු සඳහා උපදෙස්දීමට බලය දෙනු ලැබූ තැනැත්තන්ගේ නම්; - නිලධාරි මණ්ඩලයේ ජාතික හැඳුනුම්පත්වල පිටපත්; - සංවිධානයේ ස්වභාවට සහ වර්ගය අනුව අදාළ වෙනත් ලේඛන/අනුමැතීන්, යන ලේඛන සමග ගිණුම විවෘතකිරීමේ අයදුම්පත් පුරවා ඕනෑම බැංකු ශාඛාවක් වෙත ලබාදෙන්න.	- සංවිධානයේ නම, ලියාපදිංචි ලිපිනය වෙනස්කිරීමක දී සහ නිලධාරි මණ්ඩලයේ නිල නාමයන්/ තනතුරුවල වන වෙනසක් පිළිබඳ නොපමාව බැංකුවට දැනුම්දීමේ වගකීම නිලධාරි මණ්ඩලය සතුය.
ලංකා බැංකුවේ සංසද - ජංගම ගිණුම	• 'BOC සංසද' ජංගම ගිණුම සඳහා කොළ 25ක පළමු චෙක්පොත නොමිලයේ නිකුත්කරනු ලැබේ.	• ගිණුමේ ඇති අවම මාසික සාමාන්‍ය ශේෂය රු.7,500/-ට අඩු වේ නම්, මාසිකව යම් ගාස්තුවක් අයකරනු ලැබේ.		

රක්ෂණ ආවරණ තැන්පතුව /අනවසර ගනුදෙනු (අතපසුවීම්)/ අක්‍රීය ගිණුම් පිළිබඳ වාර්තාකිරීම

- තැන්පතුකරුවකුට රු.1,100,000 ක උපරිමයක් දක්වා වන්දි සඳහා අදාළ වාරික ගෙවීම මත මුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනාක්‍රමය අනුව තැන්පතු වගකීම් රක්ෂණය කර ඇත.
- අනවසර/ අතපසුවූ ගනුදෙනුවක් හඳුනාගතහොත්, ඒ පිළිබඳ බැංකුවට හෝ ගිණුම පවත්වාගෙනයන ශාඛාවට වහාම වාර්තාකළ යුතුය.
- කිසිම මුදල් ආපසුගැනීමක්/ගෙවීමක් නොකර අවුරුද්දක (01) කාලයක් ගිණුම අක්‍රීයව පැවතියහොත්, එක් අවුරුද්දක් අවසානයේ ගිණුම 'අක්‍රීය' වනු ඇත.
- අවුරුදු 10කට වැඩි කාලයක් එම ගිණුම් සක්‍රීයව පැවති බවට කිසිදු සාක්ෂියක් නොමැති නම්, එම ගිණුම්වල පවතින මුදල් අත්හැර දැමූ දේපළක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මාරුකරනු ලැබේ.

ඔබේ අදහස් අප හා බෙදාගන්න

- ගනුදෙනුකරුවන්ට පහත දැක්වෙන කුමන හෝ ක්‍රමයකින් සිය අදහස් සහ පැමිණිලි යොමුකළ හැකිය;
- අපගේ ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරණ අංශය හරහා ඔබේ ඇගයීම්/ පැමිණිලි යොමු කළ හැකිය. ඔබේ ඉල්ලීම් ස්වයංක්‍රීය පද්ධතියක් හරහා ප්‍රමුඛතාව පදනම් කොටගෙන සලකා බලනු ලැ
- **දුරකතන:** +94 11 220 4750 / +94 11 243 5814 **ෆැක්ස්**: +94 11 243 5815 **විද්‍යුත් ලිපිනය**: bocexmgt@boc.lk **වෙබ් අඩවිය:** https://www.boc.lk
- **තැපෑල:** ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරු , 22වන මහල, ලංකා බැංකු කුළුණ, ලංකා බැංකු චතුරශ්‍රය, අංක. 1, ලංකා බැංකු මාවත, කොළඹ 01.

  අපගේ කුමන හෝ ශාඛාවක්, සේවා ඒකකයක්, හෝ ඇමතුම් මධ්‍යස්ථානය අමතන්න.අපගේ නිමැවුම් හෝ සේවා සම්බන්ධයෙන් ඇති ඕනෑම විමසීමක් අපගේ ඕනෑම බැංකු ශාඛාවක් වෙත හෝ ඇ
  මධ්‍යස්ථානය වෙත යොමු කරන්න. 1975 (ඇමතුම් මධ්‍යස්ථානය) අමතා ඔබට ළඟම ශාඛාව සොයාගන්න.